# මාතර ඇමරිකන් පියස දියත් කිරීමේ උත්සවයේ දී
# ඇමරිකන් තානාපතිනි ඇලයිනා ටෙප්ලිට්ස් ප්‍රකාශ කළ අදහස්
# පෙබරවාරි 26, 2019

අද මෙතැන ජනයාගෙන් පිරුණු ශාලාවක් දැකීම සතුටක් මෙන් ම ඇමති සමරවීරගේ කාරුණික අදහස් දැක්වීම ගැන ස්තුති කිරීමට කැමැත්තෙමි. අද අප සමග එක්වීම ගැන වාණිජ මණ්ඩලයේ සභාපති, එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, මිතුරන් සහ හවුල්කරුවන් ඇතුළු සියලු දෙනාටම ස්තුති කරමි. අද මෙම ඇමෙරිකානු පියස දියත් කිරීමට ලැබීම ඇත්තෙන්ම සතුටට කරුණකි. ඇමතිවරයා අවධාරණය කළ පරිදි, මෙය ආරම්භ කිරීමට වසර ගණනාවක් ගතවූ අතර, දැන් එය අපට දකුණු පළාතේ ජනතාව සඳහා විවෘත කළ හැකියි.

මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම තුළින් අපේ හවුල්කාරීත්වය සාක්ෂාත් කර ගත හැකි වීම ගැන මම සැබැවින් ම සතුටු වෙමි. ඔබ වීඩියෝවෙන් දුටු පරිදි මෙය පිහිටුවන ලද්දේ කොළඹ, යාපනය සහ මහනුවර යන නගරවල ඇති මධ්‍යස්ථාන තුනට අමතරයි. මෙම මාතර මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට නොහැකි වූයේ නම් ඇත්ත වශයෙන් ම අපේ උත්සාහය සම්පූර්ණ නොවනු ඇත. දකුණු පළාතේ සහ ශ්‍රී ලංකාව පුරා මෙම නගරය ප්‍රසිද්ධියට පත් වී ඇත්තේ වාණිජ හා ව්‍යවසායකත්ව කේන්ද්‍රස්ථානයක් ලෙස වන අතර, මේ අසල රුහුණු විශ්ව විද්‍යාලය පිහිටා ඇති බැවින් එහි සිසුන්ට ප්‍රයෝජනවත් වන ලෙස , මෙම මධ්‍යස්ථානය මෙහි ස්ථාපිත කිරීම ඉතා යෝග්‍ය වේ.

ඇමතිතුමා විසින් ද සඳහන් කළ පරිදි ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන වෙළෙඳපොළ ඇමෙරිකා එක්සත් ජනපදය යි. ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය, නිෂ්පාදන සහ සේවා අංශවල රැකියා දහස් ගණනකට ඇමරිකන් පාරිභෝගිකයන් සෘජුව ම අනුග්‍රහය දක්වයි. පසුගිය දස වසර තුළ අපේ ද්වි-පාර්ශවික වෙළඳාම 40% කින් වැඩි වී තිබේ. 2017 දී රුපියල් බිලියන 410 ක් වූ මෙම වෙළඳාම 2017 වන විට රුපියල් බිලියන 571 ඉක්මවා තිබේ. මෙම සබඳතාව වර්ධනය වනු ඇතයි මම බලාපොරොත්තු වෙන අතර අනාගතයේ දී දෙපැත්තෙන් ම කෙරෙන ආයෝජන වැඩි වනු ඇතැයි විශ්වාස කරමි.

මෙම වර්ධනය වන සංඛ්‍යාවන්ට දායක වන ප්‍රජා නායකයන් සහ ව්‍යාපාර හිමියන් අද මෙහි ඔබ අතර සිටී. ලංකාවේ සමෘද්ධිමත් අනාගතයට දායකත්වයක් සපයන තරුණ ශ්‍රී ලාංකිකයන්ට ඔබ පරමාදර්ශයක් වන අතර, නව්‍යකරණය, පරිශ්‍රමශීලිබව සහ නව දැක්මක් තුළින් ශ්‍රී ලංකාවේ සෞභාග්‍යය ගොඩනගන්නේ ඔවුන් ය.

ඔබේ එම ප්‍රයත්නයේ දී ඔබට සහාය වීමට ඇමරිකන් පියසට හැකි වනු ඇත. අප නොමිලේ ලබා දෙන වැඩසටහන් වලට සහභාගි වීමට ඔබ මෙහි සාමාජිකයෙක් විය යුතු වුවත් ඒ සඳහා සාමාජික ගාස්තුවක් අය නො කරන බැවින් එම සහාය ඔබට නොමිලේ ලබා ගත හැකි බව මම නැවතත් අවධාරණය කරමි. මෙම වැඩසටහන් සකස් කර ඇත්තේ මෙහි ප්‍රාදේශීය ප්‍රජාවේ අවශ්‍යතා සපුරාලීම ඉලක්ක කර ගනිමිනි. මෙම මධ්‍යස්ථානය භෞතික අවකාශයකට වඩා වැඩි දෙයකි. එය සංකල්ප වර්ධනය කරන ස්ථානයකි. දකුණු පළාත පුරා සිටින තරුණයන්ට අපේ ත්‍රිමාන මුද්‍රකය භාවිතා කරමින් මූලාකෘති නිර්මාණය කිරීමට දැන් අවස්ථාව ලැබී තිබේ. ඔබ මෙහි ඇතුල් වන විට පහනට පිටුපසින් ඇති එම මුද්‍රකය ඔබ දකින්නට ඇත. මෙම ස්ථානයෙන් ඔබට ව්‍යාපාරික ඉංග්‍රීසි ඉගෙන ගැනීමට අවස්ථාව සැලසේ. ඒ මගින් ව්‍යවසායකයින්ට තම නිෂ්පාදන ආයෝජකයින්ට අලෙවි කළ හැකිය. ඔවුන්ගේ සන්නාමය සහ ඔවුන්ගේ ව්‍යාපාර ගොඩ නැඟීමට සමාජ මාධ්‍ය යොදා ගත හැකි ආකාරය මෙහිදී ඉගෙන ගත හැකි වේ. මේවා අප තරුණ ප්‍රජාව තුළ දියුණු කිරීමට බලාපොරොත්තු වන කුසලතා සහ ප්‍රතිභාවන්ගෙන් සමහරකි. මාතර ඇමරිකන් පියස ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරන අතර ශ්‍රී ලංකාවේ දීප්තිමත් තරුණයින්ට ඔවුන්ගේ අදහස් සංකල්පයේ සිට යථාර්ථය දක්වා දියුණු කිරීමට අවශ්‍ය ඉඩ හා සම්පත් ද ලබා දෙනු ඇත.

ඇත්ත වශයෙන් ම, ශ්‍රී ලංකාවේ රැකියා සහ ව්‍යාපාරික අවස්ථා පුළුල් කිරීමට උපකාර වන වැඩසටහන් ගණනාවක් සඳහා එක්සත් ජනපද තානාපති කාර්යාලය සහාය දක්වයි. ඇමතිතුමා මෙයින් කීපයක්

ගැන සඳහන් කළ අතර මම තව එකක් ගැන සඳහන් කරන්නට කැමතියි. අපේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ආයතතනයේ යූ-ලීඩ් (YouLead) ව්‍යාපෘතියේ නියෝජිතයින් අද මෙහි පැමිණ සිටී. එම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ව්‍යසායකත්ව විෂයමාලාවේ විප්ලවීය වෙනසක් කර ඇති අතර තරුණ ව්‍යවසායකයින් දිරි ගැන්වීමට නව මෙවලම් සමග වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනඥයින් සපයයි. දකුණු පළාතේ තරුණයන්, ඇමරිකන් පියස සහ යූලීඩ් ව්‍යාපෘතියේ සංකලනය තුළින් දකුණු පළාතේ ආර්ථික ප්‍රගතිය වේගවත් කිරීමට සහායක් ලැබෙනු ඇත.

දර්ශනීය වීඩියෝ පටයේ අප දුටුවාක් මෙන්, මාතර ඇමරිකන් පියස යනු ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද නවතම මධ්‍යස්ථානයයි. මීට කලින් ස්ථාපිත කළ ඇමරිකන් පියස දෙකක් යාපනයේ හා මහනුවර ක්‍රියාත්මක වේ. බොහෝ තරුණ ශ්‍රී ලාංකිකයින්ට වෙනස් ආගමක හෝ වෙනත් ජනවාර්ගික පසුබිමක් ඇති හෝ දිවයිනේ වෙනත් කොටසක කෙනෙක් හෝ පළමු වරට මුණගැසීමට අවස්ථාවක් ලැබෙන්නේ ඇමරිකන් පියසකදීය. ඇමරිකානුවන් වන අප ලෝකයේ විවිධ ස්ථානවලින් පැමිණි ආකාරයට ම මෙය ද විවිධ මිනිසුන් අතර මිත්‍රත්වයක් ඇති කර ගැනීමටත්, එකිනෙකා දැන හැඳින ගැනීමටත් හැකි ස්ථානයකි. ඇමරිකන් පියස තුළින් ශ්‍රී ලාංකීක තරුණයන්ට එකිනෙකා සමඟ කටයුතු කිරීමටත්, විවිධ සාම්ප්‍රදායන් ගැන ඉගෙන ගැනීමට මෙන්ම ස්ථාවර, සාමකාමී හා බහුත්වවාදී ප්‍රජාතාන්ත්‍රික රටක් ලෙස ශ්‍රී ලංකාව දියුණු කිරීමට දායකත්වයක් ලබා දිය හැකි වේ..

මෙම ඇමෙරිකන් පියස විවෘත කිරීම, ශ්‍රී ලංකාව හා සියලු ශ්‍රී ලාංකිකයන් සමඟ කටයුතු කිරීමට ඇමරිකාවේ අභිලාෂය සංකේතවත් කරයි. වොෂින්ටනය මුළු එක්සත් ජනපදය නියෝජනය නොකරන ආකාරයට ම කොළඹ සමස්ත ශ්‍රී ලංකාවේ නියෝජනයක් නොවේ. අපගේ පොදු අවශ්‍යතා සහ අපගේ වටිනාකම් ගැන කතා කිරීමට රට පුරා සිටින ශ්‍රී ලාංකිකයන් මුණගැසීම අපට අවශ්‍යයි. සෑම තැනකම අවස්ථා සහ සමානාත්මතාව නිර්මාණය කිරීම සඳහා එකට වැඩ කිරීමට අපට අවශ්‍යයි.

අද අප සමග මෙම අවස්ථාවට එක්වීම ගැන මම ඔබට නැවතත් ස්තුති කරමි. ඔබේ පවුල්, මිතුරන් හා සගයන් අතර ඇමරිකන් පියස පිළිබඳ පණිවුඩය පතුරුවා හරිනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. මෙය ඔබේ ස්ථානය වන අතර, ඔබ එහි නිර්මාණය කිරීමට යන්නේ කුමක්දැයි දැකීමට අපි පුල පුලා බලා සිටිමු. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මෙන් ම අනාගතයේ ලබා දෙන සහයෝගය ගැනත් වාණිජ මණ්ඩලයට නැවතත් ස්තුති කිරීමට කැමැත්තෙමි. ඔබේ හවුල්කාරිත්වය ගැන අප සැබවින්ම සතුටු වන අතර, ප්‍රජාවේ ඔබ සියළු දෙනා සමඟ සම්බන්ධ වීමට ලැබීම ගැන සතුටු වෙමි. ඔබ සැමට ස්තුතියි!